සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

# තෙවන වාර පරීක්ෂණය - 8 ශ්‍රේණිය - 2019

# Third Term Test - Grade 8 - 2019

නම/විභාග අංකය :........................................ නාට්‍ය හා රංග කලාව කාලය: පැය 02යි.

සැලකිය යුතුයි :

- පළමු කොටසේ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. එක් ප්‍රශ්නයක් සඳහා ලකුණු දෙක බැගින් හිමිවේ.
- දෙවන කොටසේ පළමු ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න තුනකට පමණක් පිළිතුරු සපයන්න.

## I කොටස

- **නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන් පුරවන්න.**

**(ගැටුම, ආහාර්ය අභිනයට, රංග විධාන, රචකයා, තේමාව, නාට්‍යමය අත්දැකීම්)**

(1) නාට්‍ය මුලින් ම රඟ දැක්වෙන්නේ නාට්‍ය රචකයාගේ මනසේ ය. එය පිටපතේ ඇතුළත් .................................................. මගින් පිළිබිඹු වේ.

(2) ........................................... යනු නාට්‍ය පෙළින් ප්‍රකාශ වන අදහසයි.

(3) ........................................... තම ජීවන ගැටළු සාර්ථකව නිරාකරණය කර ගැනීමට දායක කර ගත හැක.

(4) ........................................... යනු නාට්‍යක තිබිය යුතු අත්‍යාවශ්‍ය අංගයකි.

(5) නාට්‍යක අනුශාංගික කලා ............................................... අයත් වේ.

- **නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

(6) නාට්‍ය අධ්‍යක්ෂක වරයෙක් නොවන්නේ,
(i) එදිරිවීර සරත්චන්ද්‍ර (ii) දයානන්ද ගුණවර්ධන
(iii) මාර්ටින් වික්‍රමසිංහ (iv) සයිමන් නවගත්තේගම

(7) රංග ක්‍රීඩාවක් වන්නේ,
(i) හිම කන්ද දියවීම (ii) බුද්ධගජ්ජය කියවීම
(iii) රාක්ෂයෙක් ගමට ඇවිත් (iv) බැලුනය පිම්බීම

(8) අනුශාංගික කලාවට අයත් නොවන අංගය වන්නේ,
(i) අංග රචනය (ii) වේදිකා පසුතල
(iii) වාචික අභිනය (iv) රංග වස්ත්‍ර

(9) චරිත සඳහා ගැළපෙන නළු නිළියන් තේරීම හඳුන්වන්නේ,
(i) රූපණය යනුවෙනි. (ii) ආංගික අභිනය යනුවෙනි.
(iii) අනුකරණය යනුවෙනි. (iv) නළුවරණය යනුවෙනි.

(10) අභිරූපණ රංගනයකදී අදාල නොවන අභිනය වන්නේ,
(i) ආංගික අභිනයයි (ii) වාචික අභිනයයි.
(iii) සාත්වික අභිනයයි. (iv) ආහාර්ය අභිනයයි.

। **පහත සඳහන් ප්‍රකාශ හරි නම් (3) ලකුණ ද වැරදි නම් (7) ලකුණ ද ඉදිරියේ ඇති වරහන් තුළ යොදන්න.**

(11) නාට්‍යධර්මී නාට්‍යයේ දී සංගීතයට විශේෂ ස්ථානයක් හිමි වේ. ( )

(12) ශ්‍රී ලංකාවේ නාට්‍ය සඳහා ජාතක කතා යොදාගෙන නැත. ( )

(13) උඩරට ශාන්ති කර්ම සඳහා යක් බෙරය භාවිතා කරයි. ( )

(14) ''සාන්තුවර සෙබළාණෝ'' නාට්‍ය සුගතපාල ද සිල්වා නිර්මාණය කළ නාට්‍යයකි. ( )

(15) නාට්‍ය පෙළ රචනයේ දී මුල, මැද, අග ගැලපිය යුතු නැත ( )

। **පහත ප්‍රශ්න සඳහා කෙටි පිළිතුරු ලියන්න.**

(16) සේරිවාණිජ ජාතකය ඇසුරින් නිර්මාණය කළ නාට්‍ය කුමක් ද?

.............................................................................................................................................

(17) 'අමර ගියා දිව්‍යලෝකේ' නාට්‍යයේ නිර්මාණකරුවා නම් කරන්න.

.............................................................................................................................................

(18) වේදිකා පසුතල නිර්මාණයේ දී අවධානය යොමු කළ යුතු වැදගත් කරුණක් නම් කරන්න.

.............................................................................................................................................

(19) ශ්‍රව්‍ය දෘශ්‍ය සජීවී කලාවක් නම් කරන්න.

.............................................................................................................................................

(20) සාත්වික අභිනය යන්න කෙටියෙන් හඳුන්වන්න.

.............................................................................................................................................

(ල. $2 \times 20 = 40$)

# II කොටස

- පළමු වන ප්‍රශ්නය අනිවාර්ය ප්‍රශ්නයකි.
- පළමු ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න 3 ක් සඳහා පිළිතුරු සපයන්න.

---

(1) පහත දී ඇති ගීත කොටස ඇසුරින් අසා ඇති ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

''රොන් මැස්සෝ රොන් ගෙනෙතී
මුර මැස්සෝ මුර කරති
සෙසු මැස්සෝ වද හදති
එකමුතු වී වැඩ කරති

රොන් මැස්සෝ මල් සොයතී
රොන් අරගෙන පැණි හදතී
තුඩින් තුඩේ පැණි ගෙනවිත්
වද තුළ අහුරා ගනිතී''

(i) ඉහත නාට්‍ය ගීතය ඇතුළත් නාට්‍ය නම් කරන්න. (ල. 1)

(ii) එහි නිර්මාණකරුවා නම් කරන්න. (ල. 1)

(iii) එම ගීතය ඇතුළත් නාට්‍යයෙහි ප්‍රධාන චරිත 2 ක් නම් කරන්න. (ල. 2)

(iv) නාට්‍ය තුළ ඉහත ගීතය ගායනා කරන්නේ කිනම් චරිත විසින්ද? (ල. 2)

(v) ඉහත ගීතය ඇතුළත් නාට්‍යයේ නාට්‍යමය අවස්ථා 2ක් නම් කරන්න. (ල. 2)

(vi) ඔබ දන්නා ළමා නාට්‍ය 2 ක් නම් කරන්න. (ල. 2)

(2) (i) ආනුශංගික කලා 4ක් නම් කරන්න. (ල. 4)

(ii) ඉන් එක් ආනුශංගික කලාවක් තෝරා ගෙන එය නාට්‍යක් සඳහා නිර්මාණය කිරීමේදී සැළකිලිමත් විය යුතු කරුණු 6ක් ලියන්න. (ල. 6)

(3) (i) රංග අභ්‍යාස හඳුන්වන්න. (ල. 2)

(ii) රංග අභ්‍යාස වර්ග 3ක් නම් කරන්න. (ල. 3)

(iii) රංග ක්‍රීඩා යන්න හඳුන්වන්න. (ල. 2)

(iv) රංග ක්‍රීඩා 3ක් නම් කරන්න. (ල. 3)

(4) (i) ජාතක කතා ඇසුරින් නිර්මාණය වූ නාට්‍ය 4 ක් නම් කරන්න. (ල. 2)

(ii) ආගමික කතා තේමා කොටගත් නාට්‍යවලින් සමාජයට ලැබෙන ප්‍රයෝජන 2 ක් ලියන්න. (ල. 4)

(iii) නාට්‍ය නිර්මාණය කිරීම සඳහා දායක කර ගත හැකි බෞද්ධ නොවන වෙනත් ආගමික ග්‍රන්ථ 2ක් ලියන්න. (ල. 4)

(5) ඔබ අසා ඇති ජන කතාවක් ඇසුරින් සංවාද දෙබස් සහිත සරල නාට්‍ය පිටපතක් රචනා කරන්න. (ල. 10)

Answer

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

# තෙවන වාර පරීක්ෂණය - 8 ශ්‍රේණිය - 2019

# Third Term Test - Grade 8 - 2019

## නාට්‍ය හා රංග කලාව - පිළිතුරු පත්‍රය

### I කොටස

| | | | |
|---|---|---|---|
| (1) | රංග විධාන | (11) | 3 |
| (2) | තේමාව | (12) | 7 |
| (3) | නාට්‍යමය අත්දැකීම් | (13) | 7 |
| (4) | ගැටුම | (14) | 3 |
| (5) | ආහාර්ය | (15) | 7 |
| (6) | (iii) | (16) | කදා වළලු |
| (7) | (iii) | (17) | පාලිත ලොකුපෝතාගම |
| (8) | (iii) | (18) | නාට්‍යයේ තේමාව |
| (9) | (iv) | (19) | වේදිකා නාට්‍ය |
| (10) | (ii) | (20) | මුහුණේ ඉරියව් මගින් අදහස් ප්‍රකාශ කිරීම (නිවැරදි පිළිතුරු සඳහා ලකුණු ලබා දෙන්න.) |

(ල. 1 × 20 = 20)

### II කොටස

(1) (i) වලහා සහ මාෂා (ල. 1)

(ii) ඩී. කුමාරගේ (ල. 1)

(iii) වලහා, මාෂා (ල. 2)

(iv) මී මැස්සෝ විසින් (ල. 2)

(v) වලහා සහ මාෂා හමු වන අවස්ථාව
මී වද පෙට්ටිය තුළ වලහා සැඟවී මාෂා සමග කතා කරන අවස්ථාව
වලහා මී වද පෙට්ටියෙන් පිටතට එන අවස්ථාව
(නිවැරදි පිළිතුරු සඳහා ලකුණු ලබා දෙන්න) (ල. 2)

(vi) අමර ගියා දිව්‍යලෝකේ, තොප්පි වෙළෙන්දා, පුංචි අපට දූන් තේරෙයි.. ආදී වශයෙන් (ල. 2)

(2) (i) අංග රචනය
රංග වස්ත්‍රාභරණ නිර්මාණය
වේදිකා පසුතල නිර්මාණය
රංග භාණ්ඩ නිර්මාණය (ල. 4)

(ii) අදාල පිළිතුරු සඳහා ලකුණු ලබා දෙන්න. (ල. 4)

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# Provincial Department of Education - NWP

## තෙවන වාර පරීක්ෂණය - 8 ශ්‍රේණිය - 2019

## Third Term Test - Grade 8 - 2019

**නම/විභාග අංකය :.......................................  නාට්‍ය හා රංග කලාව  කාලය: පැය 02යි.**

## <u>ප්‍රායෝගික පරීක්ෂණය</u>

(1) පොතෙහි ඇතුළත් කෝළම්, සොකරි, හෝ නාඩගම් ගීතයක් ගායනය කරමින් රංගනයේ යෙදෙන්න.

(ලකුණු 15)

(2) වලහා සහ මාෂා නාට්‍යයේ වලහා හෝ මාෂා යන චරිත දෙකෙන් කැමති චරිතයක් රංගනය කරන්න.

(ලකුණු 10)

(3) ඔබ කැමති අවස්ථාවක් අභිරූපණයෙන් ඉදිරිපත් කරන්න.

(ලකුණු 15)

(4) කැමති ජන කතාවක් රසවත් ලෙස ඉදිරිපත් කරන්න.

(ලකුණු 10)